**<u>ක්‍රියාන්විත සේවා පදනම මත සේවා පුද්ගලයින්ගේ ළමුන්</u>**
**<u>රජයේ පාසල්වල පළමුවැනි ශ්‍රේණියට ඇතුලත් කිරීමේ ප්‍රමුඛතාවය ගණනය කිරීම සඳහා</u>**
**<u>ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය</u>**

**<u>ලකුණු ලබාදෙනු ලබන කාණ්ඩ වර්ගීකරණය</u>**

1. වෙනත් විශේෂ ක්‍රමයක් දක්වා නොමැති නම්, මෙම ක්‍රමවේදය තුලදී අයදුම්කරුවන්ගේ එක් වසරක සේවා කාලයක් සඳහා පහත සඳහන් කාණ්ඩ වර්ගීකරණය යටතේ ලකුණු ලබාදීම කරනු ලබයි.

| | | | | |
|---|---|---|---|---|
| අ. | C - 1 | කාණ්ඩය | - | 1000 |
| ආ. | C - 2 | කාණ්ඩය | - | 800 |
| ඇ. | C - 3 | කාණ්ඩය | - | 600 |
| ඈ. | C - 4 | කාණ්ඩය | - | 400 |
| ඉ. | C - 5 | කාණ්ඩය | - | 200 |

**<u>ගුවන් හමුදා පුද්ගල කාණ්ඩ වර්ගීකරණය</u>**

2. **<u>ක්‍රියාන්විතයේදී මියගිය/අතුරුදන් වු/ආබාධිත තත්වයට පත්වුඅය</u>**. ක්‍රියාන්විතයේදී මියගිය, අතුරුදන් වු සහ අබාධිත තත්වයට පත්වු හෝ වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වු රණවිරුවන්ගේ දරුවන් හට, සුභසාධක අධ්‍යක්‍ෂක මගින් ලබා දෙන්නාවු ප්‍රමුඛතා ලැයිස්තුවේ දක්වා ඇති අනුපිළිවෙලට අනුව, අනෙකුත් සියල්ලන් අභිබවා ප්‍රමුඛත්වය ලබාදෙනු ලැබේ.

3. **<u>ක්‍රියාන්විත සඳහා දැක්වු දායකත්වය</u>**. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දැනට සේවයේ සිටින පුද්ගලයින් ක්‍රියාන්විත සඳහා දැක්වු දායකත්වය අනුව පහත දැක්වෙන පුද්ගල වර්ගීකරණය සිදුකර ඇත. එම එක් එක් වර්ගීකරණය සඳහා සලකා බලනු ලබන උපරිම සේවා කාලය "වසර (10) ක සේවා කාලය සහ වසර 10 ඉක්මවු සේවා කාලය" වශයෙන් බාණ්ඩ දෙකකට ලකුණු ලබාදීම කරනු ලැබේ.

| | **<u>ගුවන් යානා ක්‍රියාන්විත කාර්ය මණ්ඩල සාමාජිකයින්</u>** ( ක්‍රියාන්විත දායකත්ව සේවා කාලය) | | | |
|---|---|---|---|---|
| | | | වසර 10 ක සේවා කාලයක් දක්වා | වසර 10 ඉක්මවු සේවා කාලය සඳහා |
| අ. | ගුවන් නියමු | ගුවන්යානා පක්‍ෂාංගයක ස්ථිර සේවයේ යෙදී සිටි කාලය සඳහා | C - 1 | C - 3 |
| ආ. | ගුවන්යානා ඉංජිනේරු<br>ගුවන් අවිකරු<br>බර පාලන නිළධාරි<br>ගුවන් නිරීක්‍ෂණ කාර්ය මණ්ඩලය | සක්‍රීයවම සේවයේ යෙදී සිටි කාලය පමණක් (වසර ගණන) සලකා බලනු ලැබේ. | C - 1 | C - 4 |
| ඇ. | **ක්‍රියාන්විත බලඝණ සහායක කාර්ය මණ්ඩලය - 2009 දෙසැම්බර් 31 දක්වා කාලය පමණක් සලකා බලනු ලබන අතර, ඔවුන්ගේ ඉතිරි සේවා කාලය අදාල අනෙකුත් වර්ගීකරණයන් යටතේ සලකා බලනු ලැබේ.** | | | |
| | **(1) පියාසර බලඝණයන් හි තාක්ෂණික කාර්ය මණ්ඩල.** | | | |
| | කාර්මික ඉංජිනේරු / ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු නිළධාරීන්.<br>ගුවන් යාන්ත්‍රික ශිල්පී, ගුවන් යානා විදුලි හා මෙවලම් ශිල්පී, ආරක්ෂක උපකරණ, ගුවන් යානා සැකිලි ශිල්පී, ගගන ගුවන් විදුලි, ගුවන් යානා අවි ආයුධ ශිල්පී, සාමාන්‍ය යාන්ත්‍රික ශිල්පී | සියලුම පියාසර බලඝණයන් සැලකේ. | C - 2 | C - 4 |

| | | | | |
|---|---|---|---|---|
| | **(2) නියමුවන් රහිත සැහැල්ලු ගුවන් යානා බළඝණ** | | | |
| | බාහිර නියමු නිළධාරීන්<br>අභ්‍යන්තර නියමු නිළධාරීන් | 111 සහ 112 බලඝණ | C - 2 | C - 4 |
| | කාර්මික ඉංජිනේරු / ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු නිළධාරීන් සහ කාර්මිකයන් | | | |
| | **(3) රේඩාර් බලඝණ** | | | |
| | ප්‍රහාරක යානා පාලකයන් | මේ සඳහා 2006 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාන්විත සේවය ලෙස සලකනු ලැබේ. | C - 2 | C – 4 |
| | ගුවන් ආරක්ෂක පද්ධති ක්‍රියාකරුවන් | | | |
| | කාර්මික ඉංජිනේරු / ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු නිළධාරීන් සහ එම කාර්මිකයින් | | | |
| | ගුවන් ආරක්ෂක අවි කණ්ඩායම (අංක 32 සහ 33 භූමිගත ගුවන් ආරක්ෂක පක්ෂාංගය). මේ සඳහා ගුවන් ආරක්ෂක අණ හා පාලන මධ්‍යස්ථානයේ අවි පාලකයන් ද ඇතුළත් වේ. | | | |
| ඇ | **ක්‍රියාන්විත බලඝණ සහායක කාර්ය මණ්ඩලය 2010.01.01 දින සිට වර්ගීකරණය** | | | |
| | | | **වසර 10 ක සේවා කාලය දක්වා** | **වසර 10 ඉක්මවු සේවා කාලය සඳහා** |
| | (1) පියාසර බලඝණ | බලඝණයට අනුයුක්ත සහ ස්ථාන මාරු වීම් ලබා සක්‍රියව සේවය කළ සහ සේවය කරන සියළුම නිළධාරීන් සහ සියළුම වෘත්තිකයන් මිට ඇතුළත්ය | C - 3 | C - 4 |
| | (2) නියමුවන් රහිත සැහැල්ලු ගුවන් යානා බළඝණ | | | |
| | (3) රේඩාර් බලඝණ | | | |

4. **<u>ප්‍රභූ ආරක්ෂක රාජකාරී සේවා</u>**. ජනාධිපති/ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි/ගුවන් හමුදාධිපති ප්‍රභූ ආරක්ෂක රාජකාරී සේවාවන්හි නියුක්තව සේවය කරන පුද්ගලයින් වෙනුවෙන් 2005.11.19 දින සිට 2009.12.31 දින දක්වා C - 1 කාණ්ඩය යටතේද, **2010.01.01 දින සිට පහත දැක්වෙන පරිදි ප්‍රභූ ආරක්ෂක රාජකාරී සේවා සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.**

| **රාජකාරී** | **වසර 10 ක් දක්වා** | **වසර 10 ඉක්මවු** |
|---|---|---|
| **ප්‍රභූ ආරක්ෂක රාජකාරී සේවා.** | **C - 3** | **C - 5** |

5. **<u>රාජකාරී ස්ථානය</u>**. පහත සඳහන් වර්ගීකරණයන් කාණ්ඩ දෙකකට වෙන් කර ඇති අතර එය මානුෂීය මෙහෙයුම අවසන්වීම තෙක් එනම් 2009.12.31 දිනට පෙර සහ මානුෂීය මෙහෙයුම අවසන් වීමෙන් පසු එනම් 2010.01.01 දින සිට අනුයුක්ත සහ ස්ථාන මාරු වීම් ලබා සක්‍රියව සේවය කළ සහ සේවය කරන සියළුම නිළධාරීන් සහ සියළුම වෘත්තිකයන් වෙනුවෙන් කඳවුර/ඒකකය සඳහා ලකුණු ලබා දීම සිදු කෙරේ. අයදුම්කරු/කාරිය ඉහත සඳහන් 3 වන ඡේදය යටතේ (ක්‍රියාන්විත සඳහා දැක්වූ දායකත්වය) ලකුණු ලබාගත්තේ නම්'' පහත දක්වා ඇති රාජකාරී ස්ථානය සඳහා වන වර්ගීකරණය යටතේ නැවතත් ලකුණු ලබාදෙනු නොලැබේ.

අ. **<u>2009.12.31 දින දක්වා වර්ගීකරණය</u>**.

| **රාජකාරී ස්ථානය** | **වසර 10 ක් දක්වා** | **වසර 10 ඉක්මවු** |
|---|---|---|
| **ක්‍රියාන්විත ප්‍රදේශ** | | |
| මොරවැව (පෙරාරු සහ පන්කුලමද ඇතුලත්ව) | C - 1 | C - 4 |
| වන්නි (පුලියන්කුලම, මාන්කුලම, පුරවසම්කුලමද ඇතුලත්ව) | | |
| විශේෂ මෙහෙයුම් රාශි මූලය ත්‍රිකුණාමලය(TCO) | | |
| පුළුකුනාව සහ මහඔය | | |
| පලාලි | | |
| මඩකලපුව | | |
| චින වරාය | | |
| වව්නියාව | | |
| ඉරණමඩු | | |
| මුලතිව් | | |
| අම්පාර | | |
| අනුරාධපුරය | | |

| | | |
|---|---|---|
| හිඟුරක්ගොඩ | C - 3 | C - 5 |
| පාලවී | | |
| ත්‍රිකෝණමඩු | | |
| කටුනායක (බ.ජා.ගු.තො. ඒකකයද ඇතුලත්ව) | C - 5 | නැත |
| රත්මලාන (කො.ආ.වී.චි. ද ඇතුලත්ව) | | |
| සීගිරිය | | |
| වීරවිල | | |
| කටුකුරුන්ද | | |
| ඒකල | | |
| කොග්ගල | | |
| දියතලාව | | |
| කොළඹ (රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, ආ.මා.ප්‍ර.කා, ආ.සේ.අ.හා.මා.වි සහ ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය සහ අනෙකුත් කොළඹ කඳවුරට අදාල සියළු ස්ථාන ද ඇතුලත්ව ) | | |
| මීරිගම | | |

ආ. <u>**2010.01.01 දින සිට වර්ගීකරණය**</u>.

| **රාජකාරී ස්ථානය** | **වසර 10 ක් දක්වා** | **වසර 10 ඉක්මවූ** |
|---|---|---|
| **දුෂ්කර ප්‍රදේශ** | | |
| වන්නි | C - 2 | C - 5 |
| පලාලි | | |
| ඉරණමඩු | | |
| මුලතිව් | | |
| මොරවැව | | |
| පිදුරුතලාගල (2010 අගෝස්තු 15 සිට ) | | |
| විශේෂ මෙහෙයුම් රාශි මූලය ත්‍රිකුණාමලය (TCO) | | |
| වව්නියාව | C - 3 | C - 5 |
| අම්පාර | | |
| මඩකලපුව | | |
| විද්‍යාපීඨය චීන වරාය | C - 4 | නැත |
| අනුරාධපුරය | | |
| හිඟුරක්ගොඩ | | |
| පාලවී | | |
| කටුනායක (බ.ජා.ගු.තො. ඒකකයද ඇතුලත්ව) | C - 5 | නැත |
| රත්මලාන (කො.ආ.වී.චි. ද ඇතුලත්ව) | | |
| සීගිරිය | | |
| වීරවිල | | |
| කටුකුරුන්ද | | |
| ඒකල | | |
| කොග්ගල | | |
| දියතලාව | | |
| කොළඹ : රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, ආ.මා.ප්‍ර.කා, ආ.සේ.අ.හා.මා.වි සහ ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය සහ අනෙකුත් කොළඹ කඳවුරට අදාල සියළු ස්ථාන ද ඇතුලත්ව | | |
| මීරිගම | | |

ඇ. <u>**එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා යෙදවීම**</u>. එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා යොමුගත කරනු ලබන පහත සඳහන් ගුවන් හමුදා අනුබණ්ඩවල සේවය කරන/කල නිලධාරීන් සහ සෙසු නිළයන්ට එම කාලය සඳහා C-2 කාණ්ඩය යටතේ ලකුණු ලබාදෙනු ලැබේ. මෙම අනුබණ්ඩයන්ට අයත් වන ගුවන් කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා C-1 කාණ්ඩය යටතේ ලකුණු ලබාදෙනු ලැබේ.

(1) MINUSCA මධ්‍යම අප්‍රිකානු ජනරජය
(2) UNMISS දකුණු සූඩානය
(3) MINUSTAH හයිටි ජනරජය

6. **<u>වීරත්වය සඳහා පිරිනමනු ලැබූ පදක්කම්</u>**. මෙම පදක්කම් සඳහා ලකුණු ලබාදීම පහත සඳහන් ආකාරයට සිදුකරනු ලැබේ.

| | ලබා ඇති පදක්කම් ගණන සඳහා ලකුණු ලබාදීම | | | | | |
|---|---|---|---|---|---|---|
| පදක්කම් | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| පරම වීර විභූෂණය ( PWV) | 1000 | | | | | |
| වීරෝධාර විභූෂණය (WV) | 900 | 1800 | 2700 | 3600 | 4500 | 5400 |
| වීර වික්‍රම විභූෂණය (WWV) | 800 | 1600 | 2400 | 3200 | 4000 | 4800 |
| රණ වික්‍රම පදක්කම (RWP) | 700 | 1400 | 2100 | 2800 | 3500 | 4200 |
| රණ ශූර පදක්කම (RSP) | 600 | 1200 | 1800 | 2400 | 3000 | 3600 |

7. **<u>ලබා ඇති ක්‍රීඩා ජයග්‍රහණ</u>**. ශ්‍රී ලංකා ගුවන් හමුදා පුද්ගලයන්" සිය සේවා කාලය තුල දී ලබාගත් ඒකපුද්ගල හෝ කණ්ඩායම් නියෝජනයන් සහ ජයග්‍රහණ සැලකිල්ලට ගනිමින් පහත සඳහන් ලකුණු ලබාදෙනු ලැබේ. ලබාගත් පදක්කම් සඳහා ලකුණු ලබා දෙනු ලබන්නේ" එම ජයග්‍රහණ ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාව නියෝජනය කරමින් ලබාගත්තේ නම් පමණි.

| **<u>ලබා ඇති ක්‍රීඩා ජයග්‍රහණ</u> වර්ගීකරණය** | | | | |
|---|---|---|---|---|
| | **තරඟාවලිය** | **එක් නියෝජනය කිරීමක් සඳහා** | **ලබාගත් එක් පදක්කමක් සඳහා** | |
| අ. | **ජාතික කණ්ඩායම නියෝජනය කල පුද්ගලයන්** | | | |
| | ඔලිම්පික් තරඟාවලිය | 1000 | එක් රන් පදක්කමක් සඳහා | 1000 |
| | ලෝක ශූරතා තරඟාවලිය | | එක් රිදී පදක්කමක් සඳහා | 900 |
| | පොදුරාජ්‍ය මණ්ඩලීය තරඟාවලිය | | එක් ලෝකඩ පදක්කමක් සඳහා | 800 |
| ආ | **ජාතික කණ්ඩායම නියෝජනය කල පුද්ගලයන් සහ පදක්කම්ලාභීන්** | | | |
| | ආසියානු තරඟාවලිය | 800 | එක් රන් පදක්කමක් සඳහා | 700 |
| | දකුණු ආසියානු තරඟාවලිය | | එක් රිදී පදක්කමක් සඳහා | 600 |
| | ලෝක සන්නද්ධ සේවා තරඟාවලිය | | එක් ලෝකඩ පදක්කමක් සඳහා | 500 |
| ඇ. | **ශ්‍රීලංගුහ කණ්ඩායම නියෝජනය කල පුද්ගලයන් සහ පදක්කම්ලාභීන්** | | | |
| | ශ්‍රී ලංකා සන්නද්ධ සේවා තරඟාවලිය | නැත | එක් රන් පදක්කමක් සඳහා | 200 |
| | ජාතික ශූරතා තරඟාවලිය (ක්‍රීඩා සම්මේලනය මගින් සංවිධානය කරන ලද තරඟාවලි පමණි) | | එක් රිදී පදක්කමක් සඳහා | 150 |
| | | | එක් ලෝකඩ පදක්කමක් සඳහා | 100 |

8. **<u>අයදුම් කරන අවස්ථාවේ නිළ තත්වය සලකා බැලීම</u>**. නිළය සඳහා ලකුණු ලබන්නේ අයදුම් කරනු ලබන අවස්ථාවේ නිළ තත්වය සලකා බැලීමෙන් වන අතර" ඇතුළත් කල හැක්කේ එක් නිළ තත්වයක් පමණි.

| | |
|---|---|
| ගුවන් නිළයන් | 2000 |
| ගෘෘප් කැප්ටන් | 1500 |
| විංග් කමාන්ඩර් | 1400 |
| ස්කොඩ්‍රන් ලීඩර් | 1300 |
| ෆ්ලයිට් ලේෆ්ටිනන්ට් | 1200 |
| ෆ්ලයින්ග් ඔෆිසර් | 1100 |
| පයිලට් ඔෆිසර් | 1000 |
| ප්‍රධාන බළලත් නිලධාරි | 800 |
| බළලත් නිලධාරි | 700 |
| බලපන්ති සැරයන් | 600 |
| සැරයන් | 500 |
| කෝප්‍රල් | 400 |
| නායක ගුවන් භට | 300 |

9. **සේවා කාල සීමාව** . අයදුම්කරු ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බැඳුනු දින සිට'' දරුවා පළමුවන වසරට ඇතුළත් කරන වසරට පෙර වසරේ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට'' එනම් ජනවාරි 31 දින දක්වා වු තම සේවා කාලය සඳහා සම්පූර්ණ කරන ලද එක් වසරකට ලකුණු 100 බැගින් ලබාදෙනු ලැබේ. වසරකට අඩු වු කාලසීමාවක් සඳහා B ට අනුපාතිකව ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ.

10. **විශේෂ සලකා බැලීම්**.

අ. බිරිඳ හා ස්වාමි පුරුෂයා යන දෙදෙනාම, අයදුම් කරනු ලබන අවස්ථාවේ ත්‍රිවිධ හමුදා හෝ පොලිස් සේවයේ යෙදී සිටී නම්'' එම ද්විත්ව දායකතත්වය ඇගයීම සඳහා ලකුණු 500 ක් ලබාදෙනු ලැබේ.

ආ. තම සේවා කාලයේදී නීත්‍යානුකූල සේවා අවශ්‍යතාවයක නියැලී සිටියදී අනතුරට පත් වු හෝ මරණයට පත් වු සේවා පුද්ගයන්ගේ (සියදිවි හානිකර ගැනීමට තැත්කිරීම් හෝ නීති විරෝධි කටයුතු වලට සම්බන්ධ විම් වලදී අනතුරට පත් වු හෝ මිය ගිය පුද්ගලයින් හැර) දරුවන් හටද මෙම ක්‍රමවේදය මගින් අයදුම් කිරීමට හැකිය.

ඇ. තමාගේ වසර 22ක නොකැලැල් සේවා කාලයකින් පසු විශ්‍රාම ලබාඇති සහ තමා විශ්‍රාම ගැනීමට පෙර ගුවන් හමුදාවේ ලියා පදිංචි කර ඇති දරුවන් සඳහා මෙම ක්‍රමවේදය යටතේ අයදුම් කළ හැකිය.
(සටහන: ක්‍රියාන්විතයේදී මියගිය, අතුරුදන් වු, අබාධිත සහ දැනට සේවයේ යෙදි සිටින අයවලුන්ගේ දරුවන් සඳහා ප්‍රමුඛත්වය ලබා දි ඉතිරි වන පුරප්පාඩු සඳහා)

11. අධ්‍යාපන අමාත්‍යාංශයේ අවශ්‍යතාවය මත'' අයදුම්කරුවකු ලබාගත් උපරිම ලකුණු සංඛ්‍යාව 10,000 ට සීමාවිය යුතුය. ඒ සඳහා එක් එක් පුද්ගලයා විසින් ලබාගත් **ලකුණු සංඛ්‍යාව ගුවන් ලේකම් කාර්යාලය විසින් තීරණය කරනු ලබන සංඛ්‍යාවකින් බෙදනු ලබන අතර**'' ලබාගත් අවසාන ලකුණු 10,000 ට ළඟා කිරීම සඳහා'' \උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුගේ **ලකුණු සංඛ්‍යාව ඉහත තීරණය කරනු ලබන සංඛ්‍යාවෙන් බෙදා** ලැබුණු සංඛ්‍යාව\ හා \10''000 අතර වෙනස\ සෑම අයදුම්කරුවෙකුටම එකතු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් දෙදෙනකුගේ හෝ ඊට වැඩි පිරිසකගේ ගණනය කරන ලද ලකුණු සමානවු අවස්ථාවකදී'' අදාල අයදුම්කරුවන්ගේ ජ්‍යෙෂ්ඨත්වය (නිළය'' උසස්විම ලැබු දිනය සහ සේවා අංකය) සලකාබලා ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වයේ අනුපිළිවලින් පාසැල් තෝරාගැනීමේ ප්‍රමුඛතා ලැයිස්තුව පිළියෙල කරනු ලැබේ.

13. ප්‍රමුඛතා ලැයිස්තුව අවසාන වශයෙන් සකස් කිරිමේදී මෙම ක්‍රමවේදයට පරිබාහිර විශේෂ කරුණු සලකා බැලීමේ අවසාන තීරණය ගුවන් හමුදාධිපතිතුමා සතුවේ.